**වාවාකච්චේරි ප්‍රාදේශීය සභාව**
**යාපනය දිස්ත්‍රික්කය**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශ 2016 මාර්තු 30 දින විගණනය සඳහා ඉදිරිපත් කරන ලද අතර ඉකුත් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 24 දින ඉදිරිපත් කර තිබුණි. සමාලෝචිත වර්ෂය සඳහා වූ විගණකාධිපති වාර්තාව 2016 සැප්තැම්බර් 27 දින සභාවේ ලේකම් වෙත ඉදිරිපත් කරන ලදී.

### 1.2 තත්ත්වාගණණය කළ මතය

මෙම වාර්තාවේ **1.3** ජේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් වාවාකච්චේරි ප්‍රාදේශීය සභාවේ 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය සහ මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගණකාධිකරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිමු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.3.1 ගිණුම්කරණ දෝෂ

(අ) පෙර වර්ෂ සඳහා වූ රු.57,562,303 ක මුද්දර ගාස්තු මූල්‍ය ප්‍රකාශනවලට ගෙන නොතිබූ නිසා සමුච්චිත අරමුදල අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) රු.17,522,070 ක් වූ, ඉඩම් රෙජිස්ට්‍රාර් ජනරාල් වෙතින් සමාලෝචිත වර්ෂය සඳහා ලැබිය යුතු මුද්දර ගාස්තු මූල්‍ය ප්‍රකාශනවලට ගෙන නොතිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන් මූල්‍ය ප්‍රකාශනවල ආදායම අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) සභාවට අයත් ගොඩනැගිලි 60 ක වටිනාකම මූල්‍ය ප්‍රකාශනවලට ගෙන නොතිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන් ඉඩම් හා ගොඩනැගිලි වටිනාකම අඩුවෙන් දක්වා තිබුණි.

#### 1.3.2 ලැබිය යුතු මුදල් හා ගෙවිය යුතු මුදල්

(අ) රු.71,845 ක් වූ අත්තිකාරම් 1999 වර්ෂයේ පටන්ම නිරවුල් කර නොතිබුණි.

(ආ) රු.124,907 ක් වූ ගෙවිය යුතු මුදලක් අදාල දෙපාර්තමේන්තුවට නොගෙවා තැන්පත් ගිණුමේ තබා තිබුණි.

### 1.3.3 විගණනය සඳහා සාක්ෂි නොවීම

විගණනය සඳහා අවශ්‍ය වූ තොරතුරු ඉදිරිපත් නොකිරීම හේතුවෙන් රු.73,561 ක් සඳහා වූ ගනුදෙනු විගණනයේදී සන්නිරීක්ෂණය කළ නොහැකි විය.

### 1.3.4 නීති, රීති, රෙගුලාසි ආදියට අනුකූල නොවීම්

පහත දැක්වෙන නීති, රීති සහ රෙගුලාසිවලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත 24 වගන්තිය | මාර්ග හා වීථි ලැයිස්තුව රජයේ ගැසට් පත්‍රයේ පලකර නොතිබුණි. |
| (ආ) | 1988 මූල්‍ය හා පරිපාලන රීති | |
| | (i) පරිච්ඡේදය II - රීති අංක 66 | රු.764,345 ක් වූ හිඟ ආදායම් අයකර ගැනීම සඳහා ලේකම් විසින් කටයුතු කර නොතිබුණි. |
| | (ii) පරිච්ඡේදය III - රීති අංක 32 | සභාව විසින් බදු තක්සේරු ලේඛණයක් පවත්වා නොතිබුණි. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි අංක 571 | රු.130,598 ක් වූ කල් ඉකුත් තැන්පතු සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, ඉකුත් වර්ෂය සඳහා වූ රු.25,226,674 ක් වූ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම සමඟ සැසඳුවිට, 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.27,936,006 ක් විය. රජයේ ප්‍රදාන වැඩිවීම හේතුකොටගෙන, පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.2,709,332 කින් වර්ධනය විය.

### 2.2 කාරක ප්‍රාග්ධනය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, රු.44,036,653 ක් වූ ඉකුත් වර්ෂයේ කාරක ප්‍රාග්ධනය සමඟ සැසඳුවිට සභාවේ සමාලෝචිත වර්ෂයේ කාරක ප්‍රාග්ධනය රු.48,570,097 ක් විය. එහි ප්‍රතිඵලයක් වශයෙන් කාරක ප්‍රාග්ධන රු.4,533,444 කින් වැඩි වී තිබුණි.

## 2.3 ආදායම් කළමනාකරණය

### 2.3.1 ආදායම් රැස් කිරීමේ කාර්යසාධනය

ලේකම් විසින් ඉදිරිපත් කරන ලද තොරතුරු පරිදි, සමාලෝචිත වර්ෂය සඳහා වූ ඇස්තමේන්තුගත ආදායම, තත්‍ය ආදායම සහ හිඟ ආදායම පහත දැක්වේ.

| ආදායම් විෂයය | 2015 | | 2015 දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | ඇස්තමේන්තුගත | තත්‍ය | රු'000 |
| | රු'000 | රු'000 | |
| වරිපනම් හා බදු | 110 | 91 | 646 |
| බදු කුලී | 15,859 | 10,545 | 104 |
| බලපත්‍ර ගාස්තු | 1,555 | 1,246 | 7 |
| අනෙකුත් ආදායම් | 52,626 | 66,392 | 9 |
| | 70,150 | 78,614 | 766 |

### 2.3.2 වරිපනම් බදු

සභා ප්‍රදේශයේ වූ දේපලවල වරිපනම් තක්සේරු කිරීම් වසර 10 ක් තිස්සේ සිදුකර නොතිබුණි.

### 2.3.3 උසාවි දඩ මුදල් හා මුද්දර ගාස්තු

(අ) රු.518,500 ක් වූ ලැබිය යුතු උසාවි දඩ මුදල් සමාලෝචිත වර්ෂය තුලදී අයකරගෙන නොතිබුණි.

(ආ) ඉඩම් රෙජිස්ට්‍රාර් ජනරාල් වෙතින් ලැබිය යුතු රු.73,545,330 ක් වූ මුද්දර ගාස්තු අයකරගෙන නොතිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ ආකාර්යක්ෂමතා

සභාවේ වෙළෙඳපොල සඳහා ඉදිකළ ගොඩනැගිලි 3 ක් නිශ්කාර්යව පැවතුණි.

**3.2 මෙහෙයුම් ආකාර්යක්ෂමතා**

**----------------------------**

ප්‍රජා මධ්‍යස්ථාන සංවර්ධනය සඳහා පලාත් පාලන කොමසාරිස් විසින් ප්‍රදානය කළ රු.67,536 ක් අපේක්ෂිත කටයුත්ත සඳහා උපයෝජනය කර නොතිබුණි.

**3.3 ඝන අපද්‍රව්‍ය කළමනාකරණය**

**--------------------------------**

සභා ප්‍රදේශය තුල ඝන අපද්‍රව්‍ය කළමනාකරණය විධිමත්ව ක්‍රියාත්මක කර නොතිබුණි.

**4. වගකීම්භාරය සහ යහපාලනය**

**----------------------------------**

4.1 අවිධිමත් අයවැය පිළියෙල කිරීම නිසා අයවැයගත වියදම සහ තත්‍ය වියදම අතර රු.197,672 සිට රු.5,563,640 දක්වා වූ වෙනස්කම් නිරීක්ෂණය විය.

**4.2 අභ්‍යන්තර විගණනය**

**-------------------------**

අභ්‍යන්තර විගණන කටයුතු ඵලදායි අන්දමින් මෙහෙයවා නොතිබුණි.

**4.3 විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම්**

**---------------------------------------------**

විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පවත්වා නොතිබුණි.

**4.4 වත්කම් කළමනාකරණය**

**-------------------------**

සභාව විසින් භාවිතා කරන ලද ට්‍රැක්ටරය (ලැන්ඩ් මාස්ටර්) වසර 5 කට අධික කාලයක් තිස්සේ නිෂ්කාර්යව පැවතුණි.

**5. පද්ධති හා පාලන**

**------------------**

පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කෙරේ.

(අ) අභ්‍යන්තර විගණනය

(ආ) මුදල් කළමනාකරණය

(ඇ) ගබඩා